තාක්ෂණික ආයතනය

මොරටුව විශ්වවිද්‍යාලය

2022



ආයතනයේ පාලක මණ්ඩලය විසින් **16.03.2023** *දින පවත්වන ලද* **එහි 251** *වන රැස්වීමේදී මෙම වාර්තාව අනුමත කරන ලදී*

අධ්‍යක්ෂකතුමන්ගේ සමාලෝචනය

සමාලෝචනය 2022 වර්ෂය



මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය (ITUM) ජාතික හා අන්තර්ජාතික වශයෙන් වඩාත් පිළිගැනීමට ලක් වූ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව (NDT) මෙහෙයවීම සම්බන්ධයෙන් මූලිකව වගකීමට බැඳී සිටින ප්‍රමුඛ පෙලේ උසස් අධ්‍යාපනික ආයතනයකි.

ආර්ථික අර්බුදය සහ කොවිඩ් 19 වසංගත තත්වය මධ්‍යයේ වුවද ආයතනය සිසුන් 2400 දෙනෙකු වෙනුවෙන් 2022 වර්ෂය සඳහා සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. වසර පුරා පැවති අහිතකර තත්ත්වය, 2022 වර්ෂයේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයට සැලකිය යුතු බාධා ඇති කල අතර එය වඩාත් අවදානමට ලක්විය හැකි සහ තර්ජනාත්මක අංශය බවට පත් කළද, මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ (ITUM) අධ්‍යයන කාර්යමණ්ඩලයේ සෘජු මගපෙන්වීම හා අධීක්ෂනය සහ පරිපාලනය විසින් සිදු කරන ලද දැඩි පරිශ්‍රමය හේතුවෙන් ඒ ඒ අවස්ථාවන්හිදී පැන නගින ලද ගැටළු සහගත තත්වයන්ට අප්‍රමාදව මුහුන දීමට ආයතනට හැකියාව ලැබුනු අතර ඒ හේතුවෙන් අධ්‍යන කටයුතු පසුබෑමකට ලක් නොවී පවත්වාගෙන යාමට හැකියාව ලැබුනි.

මේජර් ජනරාල් (විශ්‍රාමික) එස්. කේ. තිරුණාවුකරසු (RSP VSV USP) මහතා 2021 පෙබරවාරි 15 දින සිට බලපවත්වන පරිදි මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ (ITUM) අධ්‍යක්ෂකවරයා වශයෙන් පත්කල අතර ඔහු වර්තමානය දක්වා ආයතනයේ (ITUM) අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කරයි. සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුගත වෙමින් සීමිත සිසුන් සංඛ්‍යාවක් ඇතුලත් කරගනිමින් ආයතනය 2022 වර්ෂය සඳහා සිය අධ්‍යයන කටයුතු ආරම්භකරන ලදී. අහිතකර මූල්‍ය තත්වය සහ අප්‍රේල් මාසයේදී ඇතිවූ මහජන කැළඹීම් හේතුවෙන් වර්ෂයේ දෙවන කාර්තුවේදී ඉතා කෙටිකාලයක් සඳහා විශ්වවිද්‍යාලයය සිසුන් සඳහා වසා දැමීමට පාලනාධිකාරය තීරනය කල අතර නැවත අධ්‍යාපන කටයුතු මාර්ගගත ක්‍රමයට සිදුකිරීමට නොපමාව කටයුතු කරන ලදී. කෙසේවුවද රට නැවත යථාතත්වයට පත්වීමෙන් පසුව අධ්‍යාපන කටයුතු පූර්න ධාරිතාවයෙන් යුතුව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී

වර්ෂ 2021 සිට 2025 දක්වා වූ වර්ෂ පහක කාලය සඳහා මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය (ITUM) වෙනුවෙන් පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්ම අනුව ක්‍රියාකාරී සැලැස්ම කාලීනව ක්‍රියාත්මක වීම නියාමනය සහ තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක්ද හඳුන්වා දෙන ලදී. මීට අමතරව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන පිළියෙළ කරන ලද ඇස්තමේන්තුගත මූල්‍ය වාර්තාවක් අදාල වගකිවයුත්තන්ගේ අවධානය සඳහා යොමුකර ඇත. කෙසේ වුවද ප්‍රතිපාදනය කරන ලද අරමුදල් ඇස්තමේන්තුගත අරමුදල් අවශ්‍යතාවයට වඩා ඉතා අඩු මට්ටමක පැවතුණි. ඒ හේතුවෙන් මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය (ITUM) එහි පවත්නා ඉල්ලුමට මුහුන දීමේ දැඩි අර්බුදකාරී තත්වයකට පත්විය. . තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවශ්‍ය අරමුදල් නොසැපයීම සහ මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ (ITUM) අකාර්යක්ෂම මූල්‍ය කළමණාකරණය හේතුවෙන් ආයතනය උපයන ලද ස්වයං අරමුදල් පවා පසුගිය වර්ෂ පහක කාලය තුල අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. දැඩි ක්‍රියාමාර්ග හඳුන්වා දීමෙන් ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රතිසංස්කරණය කිරීම, නිවැරදි කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබුවද පුනරාවර්තන අරමුදල් වෙන්කිරීම් අවම අවශ්‍යතාවයට වඩා ඉතා අඩු මට්ටමක පැවතීම නිසා භාණ්ඩ හා සේවාවල මිල හදිසියේ ඉහළ යාම හේතුවෙන් ආයතනය දැඩි අපහසුතාවයකට පත්වීමට සිදුවිය.

කෙසේ වුවද අධ්‍යාපන හා පරිපාලන කටයුතු වැඩිදියුනු කිරීමේ අපේක්ෂාවෙන් පහත සඳහන් ප්‍රතිසංස්කරන/ ක්‍රියාමාර්ග/ ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලදී.

1. නව ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලා (NDT) විෂයධාරාවක් හඳුන්වාදීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගැනීම.
2. නව අතුරු ව්‍යවස්ථා හඳුන්වාදීම සහ ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.
3. පටිපාටි අත්පොත සංවර්ධනය කිරීම.
4. මෙහෙයුම් විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි අත්පොත් සැකසීම.
5. කළමණාකරන තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම (MIS)
6. ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පැවැත්වීම
7. සිසුන් සඳහා වෘත්තීය පොළ පැවැත්වීම
8. කාර්මික පුහුණුව, වෘත්තීය මාර්ගෝපදේශනය සහ පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානයක් තවදුරටත් සංවර්ධනය කිරීම

තවද මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ , (ITUM) හි ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය, පර්යේෂණ සම්මන්ත්‍රණය, නව බඳවා ගැනීම් සඳහා නම්නීකරන වැඩසටහන ඇතුළු සියලුම වැදගත් දින දර්ශන සිදුවීම් වසර තුළ පවත්වන ලදී. අවසාන වශයෙන්, ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන්, 2021 වර්ෂය තුළ මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ (ITUM) කාර්ය මණ්ඩලයේ ප්‍රගතිය, කාර්ය සාධනය සහ ජයග්‍රහණ පිළිබඳව මම සම්පූර්ණයෙන්ම සෑහීමකට පත්වෙමි.

අධ්‍යක්ෂක
මේජර් ජනරාල් (විශ්‍රාමික) එස්. කේ. තිරුණාවුකරසු (RSP VSV USP)

දැක්ම

තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

මෙහෙවර

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණ ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වය ලබා දීම.

- **සමාජයේ සහ කර්මාන්තකරනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ළඟා විය හැකි නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.**
- **නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.**
- **වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමග ක්‍රියාශීලී සංවාදයක් ඇති කිරීම.**
- **තරුණයින්ට සමාජීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.**

පටුන

1.	අධ්‍යක්ෂකතුමන්ගේ සමාලෝචනය	01
	දැක්ම	02
	මෙහෙවර	02
2.	ආයතනයේ අරමුණු	10
3.	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව (NDT) පිළිබඳ කෙටි හැඳින්වීමක්	11
4.	සංවිධාන ව්‍යුහය - 2022	15
5.	කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්	16
6.	සම්බන්ධතා තොරතුරු	17
7.	කාර්ය මණ්ඩලය සහ සිසුන් පිළිබඳ තොරතුරු	18
	7.1 සිසුන් පිළිබඳ තොරතුරු	20
	7.2 අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු	21
8.	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු	22
9.	වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	29
10.	ශිෂ්‍ය සහ කාර්යමණ්ඩල ක්‍රියාකාරකම්	33
11.	පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	34
12.	ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	34
13.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	34
14.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම්)	35
15.	මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - 2022	35
16.	තිරසර සංවර්ධන අරමුණු	36
17.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	44
18.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	49
19.	විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිලිතුරු	55

ප්‍රතිස්ථාපනයෙන් පසු මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ ප්‍රගතිය 2022 දෙසැම්බර් දක්වා

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය (ITUM) නැවත ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය යටතේ 2017 මැයි මාසයේදී රු. බිලියන 10.2 ක පිරිවැයකින් විෂයයන් සහ සිසුන් බඳවා ගැනීම යන දෙකෙහිම පුළුල් කිරීමට ඉඩකඩ සහිතව වාස්තු විද්‍යාත්මකව නවීන පහසුකම් සහිතව නිර්මාණය කර දියගම හෝමාගම සුන්දර නිවර්තන භූ දර්ශනයක අංගසම්පූර්ණ ආයතනයක් ලෙස නැවත ස්ථානගත කරන ලදී

1. පසුගිය වසර තුනේ සිසුන් බඳවා ගැනීම

2000 වසරේ ආරම්භයේ සිට වසර 17ක් පුරාවට තාක්ෂණික ආයතනය (ITUM) වෙත බඳවා ගැනීම 350කට සීමා විය. කෙසේවුවද, ප්‍රතිසංවිධානයෙන් පසු 2018 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම 480 ක් දක්වා වර්ධනය වූ අතර 2020 වර්ෂයේදී ඉතා ඉහල වර්ධනයක් සලකුනු කරමින් සිසුන් 800 ක් ලියාපදිංචි කරගැනීමට හැකි වූ අතර එය සියයට සියයක් ඉක්ම වූ වර්ධනයකි.

විෂය ධාරාව	2020	2021	2022
රසායන විද්‍යාව	50	50	50
සිවිල්	200	200	200
විදුලි	100	100	100
ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ	100	100	100
යාන්ත්‍රික	100	100	100
සමුද්‍ර	20	19	20
නාවික	20	20	20
පොලිමර්	50	50	45
රෙදිපිලි සහ ඇඟලුම් තාක්ෂණය	60	60	60
තොරතුරු තාක්ෂණය	100	100	100
එකතුව	**800**	**799**	**795**

2. අර්ධවර්ෂ ක්‍රමය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය හෝමාගම දියගම ප්‍රතිස්ථාපනය කිරීමට පෙර, තාක්ෂණ ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව වාර්ෂිකව ප්‍රදානය කරන ලදී. කෙසේ වුවද, තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලද පුළුල් අධ්‍යනයකින් අනතුරුව 2018 වර්ෂය ආරම්භයේ සිට ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවාර්ෂිකව පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව වර්ෂ තුනක ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවර්ෂ 6 ක වැඩසටහනක් එනම් අර්ධවර්ෂ 4 ක අධ්‍යයන වැඩසටහනක් හා අර්ධවර්ෂ 2 ක පුහුණු වැඩසටහනක් ලෙසට පරිවර්තනය විය.

.

3. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සාමාර්ථ

සෑම අධ්‍යයන අර්ධවර්ෂයක්ම සාමාර්ථ 25 කින් යුක්ත වන අතර සෑම පුහුණු අර්ධවර්ෂයක්ම සාමාර්ථ 06 කින් යුක්ත වේ. ඒ අනුව ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සම්පූර්ණ සාමාර්ථ සංඛ්‍යාව 112 කි.

4. මූල්‍ය හා පරිපාලන

2017 වර්ෂයේදී හා 2020 වර්ෂයේදී අනුමත කරන ලද කාර්ය මණ්ඩල තනතුරු අභ්‍යන්තර මාරුකිරීම උසස් කිරීම් සහ බාහිර අයදුම්පත් කැඳවීම තුලින් බඳවා සම්පූර්ණ කිරීමට ආයතනයට හැකිවිය. 2021 වර්ෂයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය නිර්දේශ කර කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර මේ දක්වා අනුමැතිය ලැබී නැත.

ආයතනයේ අධ්‍යයන අංශ නම්:

බහුඅවයවික සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය

යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය

සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය

රෙදිපිලි සහ ඇඟලුම් තාක්ෂණය

සිවිල් ඉංජිනේරු තාක්ෂණය

අන්තර් විනය අධ්‍යයන

විදුලි , විද්‍යුත් සහ සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණය

සම්බන්ධීකරණ නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් අන්තර් විනය අධ්‍යයන අංශය යටතේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකයක් (ELTU) ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. මෙම ඒකකය ස්ථාපිත කර ඇති අතර වර්ෂය තුල එම අංශය මගින් පවත්වනු ලැබූ වැඩසටහන් මගින් විශාල ශිෂ්‍ය සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලැබිණි.

බොහෝ දුෂ්කරතා මගහරවා ගෙන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජයග්‍රහන එහි පාලක මණ්ඩලය වෙත වාර්තා කිරීමට 2022 වර්ෂය තුළදී අධ්‍යක්ෂකවරයා සමත් විය. අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා, පාලක මණ්ඩලයේ උපදෙස් අනුව තවදුරටත් අවශ්‍ය නිවැරදි කිරීම් / වැළැක්වීමේ / පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගන්නා ලදී.

5. තත්ව සහතික ඒකකය

පිළිගත් ප්‍රමිතීන් හා එකඟ වූ අභ්‍යන්තර තත්ව සහතික පද්ධතියක අවශ්‍යතාවය ආයතනයට දිගු කාලයක සිට පැවතුනි. මෙම අරමුණ සපුරා ගනු වස්, තත්වය සහතික කිරීම, අඛන්ඩ සංවර්ධනය සහ කාර්යක්ෂම කාර්යසාධනය යන කරුණු සහතික කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව සම්බන්ධීකරන නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් තත්ව සහතික ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව සියලු වැඩසටහන් ඉගැන්වීම් ක්‍රියාපටිපාටි තත්ව ආකෘතීන්ට අනුව හැඩගස්වා භාවිතයට ගනු ලැබේ. සියලු මට්ටම් වලදී තත්වය සහතික කර ගැනීම සඳහා, තත්ව සහතික ඒකකය 2022 වර්ෂය තුළදී තවදුරටත් සංවර්ධනය කරන ලදී.

6. සිසුන්ට ආයතනය තුළ නේවාසික සහ අනෙකුත් පහසුකම් සැපයීම.

සියලු සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ. එමනිසා සිසුන් 1600 ක් සඳහා නේවාසික පහසුකම් සපයන ලදී. සිසුන්ගේ කායික හා මානසික යහපැවැත්ම වර්ධනය කිරීමේ අරමුනින් අත්දැකීම් සහිත ශාරීරික අධ්‍යාපන උපදේශකවරු දෙදෙනෙකුගේ මඟ පෙන්වීම යටතේ අංග සම්පූර්ණ ව්‍යායාම් ශාලාවක් සහ ගෘහස්ත හා එලිමහන් ක්‍රීඩා පහසුකම් හා බිම් මට්ටමේ සේවක මණ්ඩලයක සහය ඇතිව සිසුන් සඳහා ක්‍රීඩා පහසුකම් සලසා දී ඇත. සියලුම සිසුන් වෙනුවෙන් නාමික මිලකට ආහාර සැපයීම සඳහා ආයතනයේ සහනාධාර ලබන ආපනශාලා දෙකක් ක්‍රියාත්මක වේ. කාර්යාල වේලාව තුල සුදුසුකම්ලත් වෛද්‍ය කාර්යමණ්ඩලයක් යටතේ වෛද්‍ය මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වන අතර රාත්‍රී කාලයේ දී සේවා අවශ්‍යතාවය මත ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක වේ.

7. තාක්ෂණ ආයතන (ITUM) කාර්යය මණ්ඩලයට සුභසාධන පහසුකම් සැපයීම

කාර්යය මණ්ඩලය සඳහා ඉල්ලීම මත නිල නිවාස ලබා දී ඇත. ඊට අමතරව, බොහෝ අධ්‍යන හා අනධ්‍යන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා නේවාසිකාගාරවල ඉතිරි වී ඇති කාමරවල නවාතැන් පහසුකම් සලසා දී ඇත. කාර්යයමණ්ඩල ආපනශාලාවක් හා දිවා සුරුකුම් මධ්‍යස්ථානයක් සේවක සුභසාධක සංගමයේ අධීක්ෂණය යටතේ ලබා දීමට ආයතනයට හැකි වී ඇත. හෝමාගම ලංකා බැංකුවේ ශාඛාවක් තාක්ෂණ ආයතන වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර සිසුන්ට හා කාර්යය මණ්ඩලයට බැංකු පහසුකම් සලසා දී ඇත. කාගිල්ස් ෆුඩ් සිටි ශාඛාවක් එම වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර නේවාසික කාර්ය මණ්ඩලයේ හා සිසුන් ගේ අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සලසා දී ඇත.

අනාගත සැලසුම්

නව සංකීර්ණයේදී සිසුන් බඳවා ගැනීම වසරකට 1000 ක් දක්වා වැඩි කිරීමට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය සැලසුම් කර ඇත. එමනිසා මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා බඳවා ගැනීම් ක්‍රමානුකූලව වැඩි කෙරෙනු ඇත.

අධ්‍යන වැඩසටහන් මාර්ගගත ක්‍රමයට ලබාදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ තත්ව සහතික ඒකකය මගින් සංවර්ධනය කර ඇත. අධ්‍යනාංශ සිය ජාතික මෙහෙවර සමාජීය සහ කාර්මික අවශ්‍යතා සමඟ අත්වැල් බැඳගනිමින් පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් හඳුන්වාදෙමින් ඉටු කිරීමට සැලසුම් සකස් කරමින් සිටියි.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනට නව විෂයයන් ඇතුළත් කිරීමට / හඳුන්වාදීමට සහ තාක්ෂණික අධ්‍යාපනයක් සඳහා වන ගෝලීය ඉල්ලුමට විසඳුම් සෙවීම සඳහා විෂයමාලා සමාලෝචනය කිරීමට ද කටයුතු යොදා ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව Sydney Acord අනුව උපාධි පාඨමාලාවක් බවට පත් කිරීමේ යෝජනාවක් මොරටුව විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලයේ අනුමැතිය මත පරිවර්තනය සිදු කිරීමට වැඩිදුර විධිවිධාන සලසනු ඇත.

තාක්ෂණ ආයතන පහසුකම්

ආදායම් උත්පාදනය කිරීමේ අරමුනින් බහුකාර්ය ශාලාව, ශ්‍රවනාගාරය, මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය, තානායම් සහ සාප්පු සංකීර්ණය වෙළඳ දැන්වීම් මගින් ප්‍රවර්ධනය කෙරේ.

සූර්යබල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සහ විදුලිබිල පියවාගැනීම සඳහාඅරමුදල් උත්පාදනය කිරීමේ හැකියාව සොයාබැලීමට ශක්‍යතා අධ්‍යනයක් ආරම්භ කර ඇති අතර තාක්ෂණ ආයතනයේ සාප්පු සංකීර්ණයේ ඇති සියලු කඩසාප්පු සහ පොදුපහසුකම් මහජනතාවට කුලියට ලබාදීමට පියවර ගෙන ඇත.

පුස්තකාල පහසුකම්

ආයතනයේ අධ්‍යන කාලය තුලදී තොරතුරු සහ අධ්‍යයයන පරිසරයට එලදායී සහ කාලීන ප්‍රවේශය සපයමින් ඉගෙනුම් ඉගැන්වීම් සහ පර්යේෂන ක්‍රියාවලිය සඳහා ප්‍රස්තකාලය පහසුකම් සලසයි. http://opac.itum.mrt.ac.lk අන්තර්ජාල නාමාවලිය හරහා ප්‍රවේශ විය හැකි මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික සම්පත් රාශියක් එය සංරක්ෂණය කරයි. ආයතනික අධ්‍යයන කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා පුස්තකාලය හරහා බොහෝ සේවාවන් සහ පහසුකම් සපයනු ලැබේ. පුස්තකාලය ITUM-ප්‍රධාන ගොඩනැගිල්ලේ 2 වන මහලේ (U2) ඇත. අපගේ විවෘත වේලාවන් උදේ 8.30 සිට සවස 5.15 දක්වා සතියේ දිනවල සහ 8.30 සිට 4.15 දක්වා සෙනසුරාදා දිනවල සහ විභාග කාල සීමාවන් තුළ දීර්ඝ කරන ලද වේලාවන් සපයනු ලැබේ තාක්ෂණික දැනුමේ ලෝකය ගවේෂණය කිරීමට අපි සියලු දෙනා සාදරයෙන් පිළිගනිමු! (http://web.itum.mrt.ac.lk/library).

02. ආයතනයේ අරමුණු

	කලාපයේ උසස් සහ විකාශනය වන තාක්ෂණික අධ්‍යාපනයේ පෙරමග පෙන්වන්නෙකු සහ ගෝලීය ඉල්ලුමට සරිලන පරිදි රටේ තිරසාර සංවර්ධනය සඳහා සුදුසුකම් ලත් සහ කැපවූ බහුවිධ සේවා සැපයීමේ නායකයකු වීම.	1
2	තාක්ෂණික දියුණුව පිළිබඳ පර්යේෂණ සඳහා මධ්‍යස්ථානයක් වීම	
	සිසුන්ගේ පරිපූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගයක් සකස් කරන පරිසරයක් නිර්මාණය කිරීම.	3
4	.ඉගැන්වීමේ සහ ඉගෙනීමේ විශිෂ්ටත්වය අත්කර ගනිමින් සුදුසුකම් ලත් සහ අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගයක් සකස් කිරීම.	
	මූල්‍යමය වශයෙන් ශක්තිමත් සහ හොඳ පරිපාලන යාන්ත්‍රණයක් සහිත ස්වයංපෝෂිත ආයතනයක් වීම.	5
6	. විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා පවතින නවීන පහසුකම් වැඩිදියුණු කිරීම.	
	ඩිජිටල් පරිවර්තනය හරහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම	7
8	ආයතනයේ සෑම තරාතිරමකම ඉහළ මට්ටමේ තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම සහතික කිරීම.	

03. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සහ මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය පිහිටුවීමේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ මුල් ආරම්භය මරදාන කණිෂ්ඨ කාර්මික විද්‍යාලය දක්වා දිවෙයි. ඒ එමගින් ලබා දුන් දැවුරුදු කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාව හා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය සඳහා සිසුන් සූදානම් කරමින් ලබාදුන් සිව් අවුරුදු තාක්ෂනික ඩිප්ලෝමාව නිසාවෙනි. කණිෂ්ඨ තාක්ෂණික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිලිගැනීමකින් යුත් මැදි මට්ටමේ තාක්ෂණ පාඨමාලාවක් වූ අතර එය සම්පූර්ණ කල අයවළුන් රටෙහි ඉංජිනේරු අංශයේ දියුනුවට විශාල වශයෙන් දායක විය.

1960 වර්ශයේදී මොරටුව කටුබැද්දේ ප්‍රායෝගික තාක්ෂණ ආයතනය **(Institute of Practical Technology) (IPT)** පිහිටුවීමත් සමග කණිෂ්ඨ තාක්ෂණ නිලධාරී පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරු කරන ලදි. ප්‍රායෝගික භාවිතය සඳහා අරමුණු කරගත් මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කැනඩා රජයේ ආධාර මත ප්‍රායෝගික තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලදී.

ප්‍රායෝගික තාක්ෂණ ආයතනය **1966** වසරේදී ලංකා තාක්ෂණ විද්‍යාලය ලෙස උසස් කරන ලද අතර එහි සීඝ්‍ර පාඨමාලා විවිධාංගීකරණයක් සිදුවිනි. ලංකා තාක්ෂණ විද්‍යාලය මගින් පස් අවුරුදු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කළ අතර කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාවට වසරක කර්මාන්තශාලා තුල පුහුණුවක් හදුන්වා දී එය ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවට **(NDT)** සුදුසුකම් ලබන තුන් අවුරුදු පාඨමාලාවක් බවට පත්කෙරිණි. **1972** දී ලංකා තාක්ෂණ විද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සරසවියක් ලෙස උසස් වී පසුව මොරටුව විශ්වවිද්‍යාලය ලෙස ක්‍රමයෙන් වර්ධනය විය. ඉන්පසු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වාගෙන යන ලදි.

1987 වර්ශයේදී ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව **1978** අංක **16** විශ්ව විද්‍යාල පනතේ **29 (ඉ)** වගන්තිය යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වුනු අතර ඒ සඳහා ඇතුලත් වීමේ අධ්‍යාපන සුදුසුකම ලෙසට අ.පොෂ. උසස් පෙළ පිලිගැනින. මූලික වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හා ඒ හා සමාන මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය යටතේ ඇති ආයතනයක් ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය **(ITUM) 2000** අංක **3** දරණ ආඥා පනත යටතේ **2000** වර්ශයේදී ආරම්භ කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර පාඨමාලා ස්වාධීනව සංවර්ධනය කිරීම සඳහා ආයතනය වෙනම ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ගැන කෙටි හැඳින්වීමක්.

පරමාර්ථය වන්නේ අපේ රටේ කර්මාන්ත සඳහා විවිධ අංශවලින් අවශ්‍ය ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමයි. ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන විෂයයන් දහයකින් මෙහෙයවනු ලබන අතර එහි මුළු ඇතුලත් කරගැනීම් සංඛ්‍යාව 800 කි. ආයතන විසින් ලබාදෙන පාඨමාලා පහත පරිදි වේ.

රසායනික ඉංජිනේරු තාක්ෂණය	-	50
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	-	200
විදුලි ඉංජිනේරු තාක්ෂණය	-	100
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	-	100
සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය	-	20
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	-	100
නාවික අධ්‍යයන	-	20
බහුඅවයවික තාක්ෂණය	-	50
රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණය	-	60
තොරතුරු තාක්ෂණය	-	100

මීට අමතරව, ත්‍රිවිධ හමුදාවට සහ විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම බඳවා ගැනීම් 5 ක් දක්වා වෙන් කෙරේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුලත් කරගැනීම විධිමත් ක්‍රියාවලියක් තුලින් සිදුකෙරේ. පසුගිය වසර තුනක් දක්වා උසස් පෙල විභාග වලට පෙනී සිට එක් වරකදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ උසස් ගණිතය යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් සිසුන්ට මේ සඳහා අයදුම් කළ හැක. Z- ලකුණු, පදනම් කරගෙන තෝරා ගනු ලබන සිසුන් පසුව යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු මත තෝරා ගනු ලැබේ.

අංග සම්පූර්ණ ඩිප්ලෝමාධාරියකු ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවෙකු හෝ කළමණාකරුවකු හා ශ්‍රම බලකාය අතර අතරමැදි සම්බන්ධීකාරකයකු වශයෙන් කටයුතු කිරීම අපේක්ෂා කරයි. මෙම භූමිකාව සඳහා ඩිප්ලෝමාධාරියකු වෘත්තීමය වශයෙන් සංවර්ධනය කිරීම සහ ඔහු/ඇයගේ සන්නිවේදනය සහ කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ඔහු / ඇය තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය ලැබිය යුතු අතර එමඟින් ඔහුට / ඇයට වෘත්තීය ඉංජිනේරුවරයාගේ නවෝත්පාදන / නිර්මාණ අගය කිරීමට හැකි වන අතර යටත් නිලධාරීන් සමඟ සන්නිවේදනය කර එම නවෝත්පාදන / නිර්මාණ යතාර්ථයක් බවට පත් කිරීමටත් හැකි විය යුතුය.

මේ අනුව පාඨමාලාව වසර දෙකක අධ්‍යයන කාලයකින් හා අර්ධ වාර්ෂික 6 කින් යුතු වසරක කාර්මික පුහුණුවකින් සමන්විත වේ. පළමු හා දෙවන අර්ධවර්ෂ අධ්‍යයන වාරයේ විෂය කොටස් ප්‍රධාන වශයෙන් නිර්මාණය කර ඇත්තේ මූලික විද්‍යාවන්හි ශිෂ්‍යයාගේ දැනුම සමාන කිරීම, ඒකාබද්ධ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඔහු / ඇය විසින් තෝරාගෙන ඇති විශේෂිත අධ්‍යයන පථය හඳුන්වා දීම සඳහා ය. ඉංජිනේරු පුහුණුව සඳහා අවශ්‍ය මූලික කුසලතා කිහිපයකටද මෙහිදී සිසුන් නිරාවරණය වනු ඇත (උදා: කර්මාන්තශාලා තාක්ෂණය හා ඉංජිනේරු ඇඳීම).

පහත සඳහන් හේතු නිසා ඉංග්‍රීසි භාෂාව පළමු හා දෙවන අර්ධ වර්ෂ වල අනිවාර්යය විෂයකි.

i. ජාතික තාක්ෂන ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. බොහෝ සිසුන් අ.පො.ස. උසස් පෙළ දක්වා සිය අධ්‍යාපන කටයුතු සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සිදුකර ඇති නිසා ඉංග්‍රීසි භාෂා මොඩියුල සන්නිවේදන ප්‍රවීනතා වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් පිළියෙල කර ඇත.

ii. සන්නිවේදනය ඩිප්ලෝමා ධාරියාගේ වෘත්තීය චර්යාවෙහි වැදගත් භූමිකාවක් හොබවයි. එබැවින් සිසුන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවබෝධය කථන හැකියාව සහ වාර්තා රචනය පිලිබඳ සිය කුසලතාවයන් සංවර්ධනය කර ගතයුතු වේ.

තුන්වන හා හතරවන අර්ධවර්ෂ වල විෂය කොටස් සිසුන් විසින් තෝරාගන්නා ලද විෂය ක්ෂේත්‍රයෙහි ඉංජිනේරු සංසිද්ධි භාවිතයන් ප්‍රධාන වශයෙන් අඩංගු වේ.

පස්වන හා සයවන සයමාසික අදාල කර්මාන්තයෙහි ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා වෙන්කෙරේ. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) තාක්ෂණ ආයතනයේ (ITUM) පුහුණු ඉංජිනේරු සමග එක්ව පුහුණුව සඳහා ආයතන සපයා දීම සිදුකෙරේ.


. විශ්ව විද්‍යාලය විසින් අනුමත කාර්ය සාධන ක්‍රමවේද අනුව වසර තුනක අධ්‍යාපනය සහ පුහුණුව සාර්ථකව අවසන් කළ සිසුන් සඳහා ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨතා සාමාර්ත සහිතව පිරිනැමේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාධාරීන් සුදුසුකම් සපුරා වර්ශයක් ඇතුලත ඔවුන්ගේ සේවා නියුක්තතාව 100% බව පසුවිපරම් අධ්‍යනයන්ගෙන් හෙලිවී ඇත.

මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ක්‍රියාත්මක අධ්‍යාපන විෂය නිර්දේශය 2005 වර්ෂයේදී පලමුවසර සිසුන් සඳහා හඳුන්වාදෙන ලද අතර 2006 වර්ෂයේදී දෙවන වසර සිසුන් සඳහා හඳුන්වාදෙන ලදි. එහි අරමුණ කාර්මික ලෝකයේ වර්තමාන දියුනු තාක්ෂණ ක්‍රමවේදයන් ඒ හා සමානවම පවත්වා ගනිමින් තෝරාගත් අධ්‍යන ක්ෂේත්‍ර වල සිසුන්ගේ දැනුම පුළුල් කිරීම වේ.

දීර්ඝ කාලයකට පසුව තාක්ෂණ ආයතනයේ (ITUM) ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය මගින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා විෂය නිර්දේශය සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකළ අතර අධ්‍යන කටයුතු 2018 වර්ෂයේ සිට වාර්ෂික පදනමින් සයමාසික පදනමට වෙනස් කරන ලදි.

4. සංවිධාන ව්‍යුහය – මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය



05. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

01	මේජර් ජනරාල් (විශ්‍රාමික).)	එස්. කේ	තිරුණාවුකරසු	අධ්‍යක්ෂක (2021.02.16 සිට ක්‍රියාත්මක වන පරිදි)
02	එස්.එච්.එල්	ගමගේ	මහතා	උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නම් කිරීම.
03	ඒ ඩබ්ලිව්	සෙනවිරත්න	මහතා	නාවික විෂය භාර අමාත්‍යාවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නම් කිරීම
04	ආර්.එම්.ඒ.පී	සමරදිවාකර	මිය	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) සභාපතිවරයාගේ නම් කිරීම
05	මහාචාර්ය	එන්. කේ	වික්‍රමාරච්චි	මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති
06	ආචාර්ය	ඩී. පී.	චන්ද්‍රසේකර	වාස්තු විද්‍යා පීඨයේ පීඨාධිපති මොරටුව විශ්වවිද්‍යාලය
07	මහාචාර්ය	කල්‍යානි පෙරේරා	මිය	සභා නාමික (2020.02.22 සිට 2023.02.21 දක්වා)
08	මහාචාර්ය	ඒ.එස්	කරුණානන්ද	සෙනෙට් නාමික (2020.07.22 දින සිට බලපැවැත්වෙන පරිදි.)
09	ජී.ජී	ජයරත්න	මහතා	BOS/ITUM හි නම් කරන්නන් (2020.10.12 සිට 2023.10.11 දක්වා)
10	ආචාර්ය	එම්.සී.එම් සෝමරත්න	මිය	BOS/ITUM හි නම් කරන්නන් (2020.11.10 සිට 2023.11.09 දක්වා)
11	ආචාර්ය	ප්‍රියන්ත	ප්‍රේමකුමාර	UGC නාමිකයින් (2020.01.16 සිට 2023.01.15 දක්වා)
12	ආචාර්ය	වරිත්	ජයතිලක	
13	එන්.කේ	අබේරත්න ඩයස්	මිය.	

06. සබඳතා තොරතුරු



ලිපිනය

තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

දියගම

හෝමාගම

ශ්‍රී ලංකාව



දුරකතනය

අධ්‍යක්ෂ	0112124001
පොදු	0112124000
ෆැක්ස්	0112117030
විද්‍යුත් ලිපිනය	director@itum.mrt.ac.lk

07. කාර්යමණ්ඩලය සහ සිසුන් පිළිබඳ තොරතුරු

අංශය	පාඨමාලාව	මූලු සිසුන් සංඛ්‍යාව	මූලු අධ්‍යයන කාර්යමණ්ඩලය		මූලු අනධ්‍යන කාර්යමන්ඩලය
සිවිල් ඉංජිනේරු තාක්ෂණය	NDT	පුහුණු – 192 S IV – 196 S II - 197 S I - 199	කථිකාචාර්ය P – 08 V - 06 C - 01 T - 01	උපදේශක T – 11 V - 18	කොන්ත්‍රාත් 02 P - 06
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	NDT	පුහුණු – 98 S IV – 95 S II - 98 S I - 99	කථිකාචාර්ය P– 8 C- 1 V- 1	උපදේශක T - 5 V – 16	P- 31
සමුද්‍ර අධ්‍යයන	NDT	පුහුණු – 42 S IV – 39 S II - 40 S I - 40	කථිකාචාර්ය P – 1 V – 2 (ITUM) - 17 (NDA) C - 1	උපදේශක T – 0 VI- 3 (NDA)	කොන්ත්‍රාත් 2 P- 2
බහුඅවයවික සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය	NDT	පුහුණු – 88 S IV – 93 S II - 94 S I - 96	කථිකාචාර්ය P – 10 V – 05	උපදේශක T – 05 V – 01	P- 10
රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණය	NDT	පුහුණු – 61 S IV – 57 S II - 60 S I - 60	කථිකාචාර්ය P – 6 V – 1	උපදේශක T – V – 1	P- 8 T- 1
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය	NDT	පුහුණු – 197 S IV – 195 S II - 199 S I - 201	කථිකාචාර්ය P – 11 V – 03	උපදේශක T – 15 V – 11	P- 12
අන්තර් විනය අධ්‍යයන	NDT	පුහුණු – 794 S IV – 788 S II - 771 S I - 776	කථිකාචාර්ය P – 11 V – 06	උපදේශක T – 04 V – 04	P – 03
තොරතුරු තාක්ෂණය	NDT	පුහුණු – 98 S IV – 96 S II - 100 S I - 99	කථිකාචාර්ය P – 4 V – 4 C - 3	උපදේශක T – 5 V – 4	P - 02

P – ස්ථිර
C - කොන්ත්‍රාත්
NDA L – නාවික රාජ්‍ය තාන්ත්‍රික සංගමයේ කථිකාචාර්ය
T - තාවකාලික
V - බාහිර
NDA I – නාවික රාජ්‍ය තාන්ත්‍රික සංගමයේ උපදේශක

තාක්ෂණික ආයතනයේ සේවක සංඛ්‍යාව

සේවක සංඛ්‍යාව	අනුමත සේවක සංඛ්‍යාව	පවත්නා සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ප්‍රාථමික	84	58	26
ද්විතීයික	83	59	24
තෘතියික	60	46	14
ජ්‍යෙෂ්ඨ	88	65	23
එකතුව	**315**	**228**	**87**

7.1 සිසුන්ගේ විස්තර

ආයතනයට සිසුන් **800** ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර **10** කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

අධ්‍යයන අංශය	පාඨමාලාව	සිසුන් ඇතුලත් කිරීම 2022	දෙවන සය මාසික සිසුන්	සිව්වන සය මාසික සිසුන්	කාර්මික පුහුණු සිසුන්	මුළු ඩිප්ලෝමාධාරී සිසුන්	
							Repeat
සිවිල් ඉංජිනේරු තාක්ෂණ.	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	200	197 (20/21 batch)	197 (19/20 Batch)	191	100	06
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	100	97	95	98	59	06
සමුද්‍ර අධ්‍යයන අංශය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	40	40	Semester - 40 Annual -02	40	05	06
බහු අවයවික සහ රසායන ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	100	93	94	90	46	03
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	60	60	60	60	48	05
විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	200	200	200	200	100	05
අන්තර්විෂය මාලා අධ්‍යයනය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	795	800	160		-	-
තොරතුරු තාක්ෂණය	ජාතික තාක්ෂණික ඩිප්ලෝමා	96	100	100	97	-	-
Total		**1591**	**1587**	**946**	**776**	**358**	**31**

7.2 අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර (2022.12.31)

කාර්ය මණ්ඩල වර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවන සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	79	58	21
	U-AC 1 to U-AC 2	50	42	08
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	U-EX 1 to U-EX 3 (Administrative & Financial Staff)	07	07	-
	U-EX 1 to U-EX 3 (Other Executive Staff)	01	-	01
වෛද්‍ය නිළධාරී	U-MO 1	01	-	01
අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලය	U-AS 1 U-AS 2,2	10	04	06
තාක්ෂණික කාර්යය මණ්ඩලය	U- MT 1	38	22	16
ලිපිකරු හා සමාන	U-MN 1 U-MN 2,3 U-MN 4	45	37	08
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 1 to U-PL 3	84	58	26
එකතුව		**315**	**228**	**87**

08. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ කාර්යමණ්ඩලය විසින් සිදුකරනලද පර්යේෂණ වල සොයාගැනීම් දේශීයව සහ ජාත්‍යන්තරව ඉදිරිපත් කර/ ප්‍රසිද්ධ කර ඇත.

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
එස්. නාගොඩවිතාන පී.බී.ටී.කේ. ප්‍රේමරත්න	Learner Perspectives of Synchronous and Asynchronous online Education: A Comparative Study	**ජාත්‍යන්තර විද්‍යාත්මක හා පර්යේෂණ ප්‍රකාශන සඟරාව, 12 වෙළුම** **2022 ජූලි 06 දින**
එම්. එස්. විජේසිරි එස්. සී. මතුගම ඩී. ආර්. ටී. ජයසුන්දර	Improving Transparency in supply chain for better brand performance (Apparel Industry): A statistical Approach	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 – 10-28
යූ. අබේසිංහ එස්. සපරමාදු සී. හේවාවසම්	A model to assess off campus walkability of University Students in urban tropical contexts	පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව IRCITUM 2022 2022 ඔක්තෝබර් 28
ඒ.කේ.ඩී.කේ. චතුරංගි	Modeling Tea Export Earning by category in Sri Lanka: vector error correction model (VECM) approach	නවෝත්පාදන විද්‍යාව සහ පර්යේෂණ තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 2022 මැයි
ඩබ්.ඊ්. ඉරෝෂිනී එල්.පී. කුමාරසිරි ජේ.ඒ.එස්.ඩී. බන්ඩාර ඒ.කේ.ඩී.කේ. චතුරංගි පී.එල්.එල්.එම්. මානගේ	A Narrative Review of the significance of Humanities Modules for Engineering and Technological Education.	ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය (ITUM) 2022 2022 ඔක්තෝබර් 28

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
එච්.ඒ.එස්.එල් අමරසිංහ	Second Language Learning Strategic employed by Tertiary level students with special reference to students of the Institute of Technology University of Moratuwa .	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 2022 ඔක්තෝබර් 28
ඩබ්.ඊ. ඉරෝෂිනී	Macro transformation through micro changes : Promoting active learning via lecture breaks.	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 ඔක්තෝබර් 28
එස්.ඒ.අයි.එම්. සමරවීර ඩබ්.වී.ඩබ්.එච්.වික්‍රමාරච්චි එස්. වල්පලගේ එස්.එම්. එගොඩගේ ඩබ්.ඊ. ඉරෝෂිනී	Identification of optium $BaSO_4$ filler loading for natural rubber/ high – density polyethylene blend for roofing materials.	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2022 ඔක්තෝබර් 28
ජේ. එච්.උමාර්ලෙබ්බේ එස්. ෂමිස්දීන් එස්. මැටි සෙඩ්	Maritime sstudents meeting the maritime industry English standards: an analysis of types of sentences	**ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම** doi: 10.5539/elt.v15n11p84 (ERA ජනලය: **ස්විට්සර්ලන්තය**) 2022 **ඔක්තෝබර් 31**
එම්. අමිනල් ඉස්ලාම් එස්. මැටි සෙඩ් ජේ. එච්.උමාර්ලෙබ්බේ එප්. ඒ සෝහනී එස්. අප්රින්	Conceptualization of head-heart-hands model for developing an effective 21st century teacher	**මනෝවිද්‍යාවේ මායිම්** https://doi.org/10.3389/fpsyg.2022.968723 (Q1 **ජනලය: ස්විට්සර්ලන්තය**)) 2022 **ඔක්තෝබර් 14**
එස්. මැටි සෙඩ් . ඒ. එස් . හම්මාඩි ජේ. එච්.උමාර්ලෙබ්බේ	Conceptualizing a merger of Islamic values and sociolinguistic rules	ඉස්ලාමීය අධ්‍යාපනය සහ සාමය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (සමුළුව -මැලන්ග් ඉන්දුනීසියා – Full paper *ISSN 2829-047X*) 2022 අප්‍රේල්

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
ඩී.ජී.ජී. වී.උදයකුමාර අයි.ආර්.ඩී. සිල්වා එල්.ජී. චමත් එල්.කේ.ටී. ශ්‍රීමාල් ආර්. ගාල්ලගේ	Design and Fabrication of a System to Measure Thermal Conductivity of Compressible Materials	සම්මන්ත්‍රණය - 19 වැනි අධ්‍යයන සැසිය- රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2022 මාර්තු
එල්.ජී. චමත් එල්.කේ.ටී. ශ්‍රීමාල් සහ ජී.ඒ. සෙව්වන්දි	Evaluating the thermal conductivity of three-phase insulation composite using analytical and numerical methods	සම්මන්ත්‍රණය - මර්කෝන් 2022, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2022 ජූලි
ජී.ඩී.එස්. පෙරේරා පී.එච්.වී.එන්.ඒකනායන ජී.කේ.ජයතුංග එම්.පී.ජී. වන්නිආරච්චි	Comparison of drying characteristics of Sri Lankan cloves dried in a fluidized bed dryer and a convection tray dryer	IRCITUM 2022 සමුළුව 2022 ඔක්තෝබර් 28
සෝමරත්න එම්.සී.ඩබ්ලිව්	Enhancing learning skills through virtual experience-sharing sessions with industry experts: learner perceptions and performances	SLAIHEE උසස් අධ්‍යාපන සමුළුව 2022
ඉමේෂා ආර් සමරතුංග සහ පුහුල්වැල්ල ජී රත්නසිරි	BIOLOGICAL SULPHATE REDUCTION IN ANAEROBIC TREATMENT OF AMMONIA-RICH SKIM LATEX WASTEWATER	පාරිසරික ඉංජිනේරු සහ කළමනාකරණ සඟරාව *2022 දෙසැම්බර්, වෙළුම 21. අංක 12,*
ඉමේෂා රම්‍යභාෂිනී සමරතුංග සහ පුහුල්වැල්ල ගමචාරිගේ රත්නසිරි	Effect of micro aeration on sulphurous pollutantS removal from skim latex wastewater	ජලය, වාතය සහ පාංශු දූෂණය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව *ලිපිය DOI: 10.1007/s11270-022-06015-8* *කතුවැකි අත්පිටපත් අංකය: WATE-D-22-01899R1*

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
එච්.ටී.එස්. ජයලත් එම්. හේරත් සහ ජේ. එප්පාරච්චි.	Cyanate esters as a high-performing shape memory polymer: A review	**සම්මන්ත්‍රණය:** ද්‍රව්‍ය අද ඉදිරිපත් කරන ලදී. https://doi.org/10.1016/j.matpr.2022.02.121
ජේ ජීවන්ත එස්. ජයලත් සී එම්මානුවෙල් එම්. හේරත් ඊ. පෝස්ටර් එම්. ඉස්ලාම් ජේ. ලෙන්ග් ජේ. එප්පාරච්චි	Fabrication of Antimicrobial Nano Coating for Food Packaging Applications	සඟරාව: ස්මාර්ට් ද්‍රව්‍යය සහ ව්‍යුහයන්. https://doi.org/10.1088/1361-665X/ac943b
සමරවීර එස්.ඒ.අයි.එම් වික්‍රමාරච්චි ඩබ්ලිව්.වී ඩබ්ලිව්. එච්. වල්පගේ එස්.එගොඩගේ එස්.එම්.ඉරෝෂිනී ඩබ්ලිව්. ඊ	IDENTIFICATION OF OPTIMUM BARIUM SULPHATE FILLER LOADING FOR NATURAL RUBBER/HIGH-DENSITY POLYETHYLENE BLEND FOR ROOFING APPLICATION- A STATISTICAL APPROACH	ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ITUM 2022, 2022 ඔක්තෝබර් 28
නවම්මාලි ඩී.අයි. කුමාරගේ ඒ.ඩී.යූ.එස්.අමරසිංහ මහිංසස නාරායන	Path to Predict the Vapor Pressure and Enthalpy of Vaporization of the Components in Essential Oils	**සම්මන්ත්‍රණය - මර්කෝන් 2022**,
එච්. ගිම්හානි මධුෂිකා, නිළිණි යූ. ආරියදාස, සංඡා එච්.පී. ගුණවර්ධන	Decolorization of textile dyes in a fixed bed biofilm reactor	සඟරාව, රසායනික ඉංජිනේරු සහ තාක්ෂණය 21 April 2022

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
එච්. ගිම්හානි මධුෂිකා, තිළිණි යූ. ආරියදාස, සංජා එච්.පී. ගුණවර්ධන	Textile Dye Removal from Industrial Wastewater by Biological Methods and Impact on Environment	පොත් පරිච්ඡේදය; පාරිසරික හායනය: අවම කිරීම සඳහා අභියෝග සහ උපාය මාර්ග 2022 අප්‍රේල් 27
ඩී.ජී.ජී.වී. උදයකුමාර, අයි.ආර්. ද සිල්වා , එල්.ජී. චමත් , එල්.කේ.ටී. ශ්‍රීමාල්, ආර්. ගාල්ලගේ	Design and Fabrication of a System to Measure Thermal Conductivity of Compressible Materials	**සම්මන්ත්‍රණය - 19 වැනි අධ්‍යයන සැසිය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2022 මාර්තු**
එල්.ජී. චමත්, එල්. කේ.ටී. සිරිමල් සහ ජී.ඒ. සෙව්වන්දි	Evaluating the thermal conductivity of three-phase insulation composite using analytical and numerical methods	සම්මන්ත්‍රණය - මර්කෝන් 2022,, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2022 ජූලි
එන්.පී.කේ සේමානන්ද ගුණ ඒ. හේවා	Estimation of Low Statistics for Sustainable Water Resources Management in South Australia	ජර්නලය: ජල විද්‍යාව ප්‍රකාශනය : 24 අගෝස්තු
ඩබ්ලිව් එල් එස් මධුරංග	A Wind Hazzard assessment for Sri Lanka	ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකාව - වාර්ෂික සැසිය 2022
ජී කේ පී ජෝන්, කේ ජී එන් එච් විරසිංහ සහ ආර් යූ හල්වතුර	Effect of Local Waste Materials on the Properties of the Green Roof Substrate	පළාත් පාලන සහ නායකත්වය පිළිබඳ පළමු ජාත්‍යන්තර සමුළුව 2022 ඔක්තෝබර් 05 සිට 07 දක්වා

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

කතෘ	පත්‍රිකාවේ මාතෘකාව	සම්මන්ත්‍රණය / සඟරාව / පොත් / ප්‍රවේශ වූ දිනය
ඩබ්ලිව්.ඒ.එස්.ඩබ්ලිව්.වික්‍රමසිංහ ,ජී.කේ.පී.ජෝන්, ආර්.යූ.හල්වතුර, ජී.වයි.ජයසිංහ, එන්.පී.කේ.සේමානන්ද	Experimental Investigation on the Manufacture of Pavement Blocks using Industrial Chemical Sludge	කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව සහ පාරිසරික තාක්ෂණය පිළිබඳ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය, රුහුණු විශ්වවිද්‍යාලය, 2022
ඒ ඩබ්ලිව් තෙඹිලියාගොඩ ආචාර්ය කසුන් ද සිල්වා	Local scour around bridge piers- A review on scour prediction, modeling and the adaptation for Sri Lankan bridges.	ව්‍යවහාරික විද්‍යාව, ඉංජිනේරු සහ තාක්ෂණය පිළිබඳ 41 වැනි ලෝක සමුළුව (WCASET-22) අතථ්‍ය සම්මන්ත්‍රණය- 25/8/2022 Abstract ID: 41st-WCASET-2022_ETH_0146
බී තෝරදෙණිය, යූ පින්තු සහ එස් එම් ජෝසප්	Engaging domestic occupants in solid waste management	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව , ISSN: 2773-705, pp.84-88
කාරියවසම් කේ ඒ ජී එස් සහ ඩබ්ලිව් බී එම් තෝරදෙණිය	The impact of ‘problem-solving small groups’ method on retention: a case study of engineering technology students at the Institute of Technology University of Moratuwa	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව , ISSN: 2773-705, pp. 10-13

පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

Authors	Title of Paper	Conference / Journal / Books / Date of accessioned
සෙනෙවිරත්න, අයි., අඹේගොඩ, ටී., විජේසේන, ආර්. සහ පෙරේරා, අයි.,	IoT-based Soil Nutrient Analyser using Gaussian Process Regression.	2022 දී පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ පිළිබඳ 2 වැනි ජාත්‍යන්තර සමුළුව *(ICARC)* (pp. 7-12). IEEE. 2022, පෙබරවාරි
විජේසේන ආර්.එන්, තිසේරා එන්.ඩී, ද සිල්වා කේ.එම්.එන්	FACIL FABRICATION OF CONDUCTIVE SILVER NETWORK THROUGH ELECTROSPINNING	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (2022 ඔක්තෝබර්)
ඉන්පරාසා එම්., විජේසේන ආර්. එන්., තිසේරා එන්.ඩී., මනතුංග ඩී.සී.	STUDY ON THE SLOW-RELEASE BEHAVIOUR OF FERTILIZERLOADED HYDROGELS	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (2022 ඔක්තෝබර්)
පබසරා වී.ජී.පී, ශ්‍රීමාලා පී.	The use of self-evaluation as a tool to enhance students' reflective practice and their confidence in laboratory classrooms.	SLAIHEE උසස් අධ්‍යාපන සමුළුව, 2022

09. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය	පුහුනු වැඩමුලුව	දින 3	යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ අනධ්‍යයන කාර්යමන්ඩලය	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය/ යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කේ.එම්. රන්සිරි මහතා මෙම වැඩසටහනේ අධ්‍යයන සම්බන්ධීකාරක වේ.
	Ms office පැකේජය/ අන්තර්ජාලය / විද්‍යුත් තැපෑල පිළිබඳ මූලික දැනුවත් කිරීමේ සැසිය	2022 අප්‍රේල් 05	යාන්ත්‍රික අංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	පුහුණු වැඩසටහනේ සංවිධානයේ නම - ජේ එම් පී ගුණසේකර සහ එච් එම් එස් බණ්ඩාර
සමුද්‍ර අධ්‍යයන	පුහුනු වැඩමුලුව	දින 3	යාන්ත්‍රික අංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය/ යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කේ.එම්. රන්සිරි මහතා මෙම වැඩසටහනේ අධ්‍යයන සම්බන්ධීකාරක වේ
	පැකේජය/ අන්තර්ජාලය / විද්‍යුත් තැපෑල පිළිබඳ මූලික දැනුවත් කිරීමේ සැසිය	2022 අප්‍රේල් 05	යාන්ත්‍රික අංශයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	පුහුණු වැඩසටහනේ සංවිධානයේ නම - ජේ එම් පී ගුණසේකර සහ එච් එම් එස් බණ්ඩාර
රෙදිපිලි සහ ඇඟලුම් තාක්ෂණය	පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පාඨමාලාව	මාස 03 07/05/2022 – 06/08/2022	විද්වතුන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන්	මෙහෙයවීම - සම්මානිත මහාචාර්ය කේ.ඒ.පී.සිද්ධිසේන

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
අන්තර් විනය අධ්‍යයන අංශය	පූර්ව අධ්‍යයන ඉංග්‍රීසි වැඩසටහන	2022 ඔක්තෝබර් 10 2022 නොවැම්බර් – 18	ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා වැඩසටහන සඳහා නව බඳවාගැනීම්	
	සහතික පත්‍ර පාඨමාලාව - කථන ඉංග්‍රීසියෙන් (ස්වයං මූල්‍ය වැඩසටහන) විහිදුම් වැඩසටහන	වැඩසටහන I – 2022 මාර්තු 05 to 2022 අගෝස්තු 06 වැඩසටහන II – 2022 ජූනි 30 සිට 2022 ජූලි 17	37 40	
	5S පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	05-01-2022	අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ තත්ව සහතික ඒකකය මගින් පවත්වන ලදී.
	අලුතින් බඳවාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා හැඳින්වීමේ වැඩසටහන	10-03-2022	අධ්‍යයන කාර්ය මණ්ඩලය	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ තත්ව සහතික ඒකකය මගින් පවත්වන ලදී.

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
අන්තර් විනය අධ්‍යයන අංශය	ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික නැටුම් පිළිබඳ වැඩමුළුව	2022 නොවැම්බර් 21	10	
	සංස්කෘතික උත්සවය (නැටුම්)	2022 නොවැම්බර් 21	50	
	වැඩමුලුව: ස්වයං සංවර්ධනය කරා යන ගමනක් පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී (මම, මම සහ මම)	2022 නොවැම්බර් 06	මොරටුව විශ්ව විද්‍යාලයේ මුස්ලිම් සිසුවියන්	එය සංවිධානය කර තිබුණේ මොරටුව විශ්ව විද්‍යාලයේ මුස්ලිම් මජ්ලිස් කාන්තා අංශය විසිනි,
	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ඉංග්‍රීසි සමාජය: අන්තර් විෂය අධ්‍යයන අංශය යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ඉංග්‍රීසි සමාජය පිහිටුවන ලදී (ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ සිට වර්තමාන තත්ත්වය දක්වා)	2022 නොවැම්බර් 12	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ සිසුන්	සමාජයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස අංශ ප්‍රධානී විසින් මාව නම් කළා.අන්තර් විනය අධ්‍යයන අංශය යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ඉංග්‍රීසි සමාජය පිහිටුවන ලදී (ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ සිට වර්තමාන තත්ත්වය දක්වා)
	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ සිසුන්ට "ජයග්‍රාහී ඉදිරිපත් කිරීම්" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී (සම්මානලාභී ටෝස්ට්මාස්ටර් විසින් පවත්වන ලදී)	2022 නොවැම්බර් 26	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ සිසුන්	සමාජයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයෙකු ලෙස මා විසින් සංවිධානය කරන ලදී.

වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර (මතු සම්බන්ධයි)

	වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු	පවත්වන ලද දින	සහභාගී වූවන්	වෙනත් කරුණු
අන්තර් විනය අධ්‍යයන අංශය	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ඉංග්‍රීසි සමාජය: විසින් පවත්වන ලද "හොඳම ඉදිරිපත් කරන්නන්ගේ අවසන් තරඟය" සංවිධානය කිරීමේදී මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ඉංග්‍රීසි සමාජයට මග පෙන්වීය.	2022 දෙසැම්බර් 07	මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ සිසුන්	ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස සමාජයට මග පෙන්වීය .
	මැලේසියාවේ Universiti Teknologi Malaysia (UTM) 2022 ඉංජිනේරු, විද්‍යාව සහ මානව ශාස්ත්‍ර පිළිබඳ ජාත්‍යන්තර උපාධි සමුළුවේ (IGCESH) විස්තීරණ සාරාංශ සඳහා සමාලෝචකයෙකු ලෙස සේවය කර ඇත	2022 අගෝස්තු		(UTM) විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි සිසුන් / කාර්ය මණ්ඩලය සහ මැලේසියාවේ සහ ඉන් පිටත වෙනත් ඉදිරිපත් කරන්නන්
	මැලේසියාවේ IGCESH 2022 සහ UTM විශ්වවිද්‍යාලයේ දින දෙකෙහිම ප්‍රධාන දේශන සංස්කරනය කිරීම	2022 අගෝස්තු	ජාත්‍යන්තර සහභාගිවන්නන්	
	මැලේසියාවේ UTM විශ්වවිද්‍යාලයේ හා IGCESH 2022 හි සිදුවීම් කමිටුවේ ප්‍රධානියා ලෙස සේවය කිරීම	2022 අගෝස්තු	ජාත්‍යන්තර සහභාගිවන්නන්	

10. ශිෂ්‍ය සහ කාර්යමණ්ඩල ක්‍රියාකාරම්









11. පුනරාවර්ථන වියදම් විස්තරය

විෂයය	2021(රු)	2022 (රු)
අ) සේවක පාරිශ්‍රමික	363,871,923.00	408,942,110.00
ආ) ගුවන් වියදම්	56,306.00	358,875.00
ඇ) සැපයුම්	9,639,804.00	17,803,269.00
ඈ) නඩත්තු	17,202,277.00	10,053,097.00
ඉ) ගිවිසුම් හා සේවා	94,190,190.00	96,269,609.00
ඊ) වෙනත්	7,890,463.00	12,553,298.00
එකතුව	**492,850,963.00**	**545,980,258.00**

12. ප්‍රාග්ධන වියදම් විස්තරය

විෂයය	2021(රු)	2022 (රු)
අ) ලී බඩු විද්‍යාගාර සහ කාර්යාල උපකරණ අත්පත්කර ගැනීම	4,784,341.00	2,403,852.00
ආ) යන්ත්‍ර සහ පිරියත අත්පත් කර ගැනීම	36,558.00	797,319.00
ඇ) ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත්කර ගැනීම		
ඈ) වෙනත්	451,820.00	1,278,401.00
එකතුව	**5,272,719.00**	**4,479,572.00**

13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වියදම්)

	2022 වර්ෂයේ ප්‍රතිපාදන(රු)	2022 වර්ෂයේ වියදම්(රු)	ඉතිරිකිරීම්/අතිරික්තය(රු)
අ) ව්‍යාපෘති පුනරාවර්ථන වියදම්	505,233,000.00	545,980,258.00	(40,747,258.00)
ආ) ප්‍රාග්ධන පුනරාවර්තන වියදම්	7,350,000.00	4,479,572.00	2,870,428.00
එකතුව	**512,583,000.00**	**550,459,830.00**	**37,876,830.00**

14. මූල්‍ය හා භෞතික ප්‍රගතියේ විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන	2022 වර්ෂයේ රැස්කිරීම්	ඌනතාවය/අතිරික්තය
අ. අභ්‍යන්තර ආදායම්	14,085,000.00	22,989,405.00	8,904,405.00
එකතුව	**14,085,000.00**	**22,989,405.00**	**8,904,405.00**

- මෙම කාලය තුල යටිතල පහසුකම් සංවර්ධනය කර නොමැති බැවින් අමතර භෞතික සංවර්ධනය පිලිබඳ සටහන් තැබීමක් සිදු කර නොමැත.

15. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2022

විෂය	සූත්‍රය	ශිෂ්‍යයකු සඳහා වියදම(රු)
අ) ශිෂ්‍යයකු සඳහා පුනරාවර්ථන වියදම	පුනරාවර්ථන වියදම/ශිෂය සංඛ්‍යාව	228,061.00
ආ) ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව	1,871.00
එකතුව		**229,932.00**

16. තිරසර සංවර්ධන අරමුණු

පෙරවදන

මෙම වාර්තාව මූල්‍ය චක්‍රලේඛ අංක 01/2018 හි අවශ්‍යතාවයක් ලෙස මොරටුවා තාක්ෂණ ආයතනයේ (ITUM) තිරසාර සංවර්ධන අරමුණු (SDGs) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු කරුණු සම්බන්ධව සාරාංශ කරයි. විගණන කමිටුවේ 41 වන රැස්වීමේ නිර්දේශයට අනුව 4 වන වගන්තිය තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සලකා බැලිය යුතු කරුණු යටතේ ක්‍රියාත්මක වීමට තිරසාර සංවර්ධන ඉලක්ක පිලිබඳ SDG පිළිබඳ කමිටුවක් 2011.02.11 දින පිහිටුවන ලදී.

1. තිරසර සංවර්ධන ඉලක්ක 04 හි ගුණාත්මක අධ්‍යාපනය

හැඳින්වීම

2030 න්‍යාය පත්‍රයට ඉලක්ක 169 ක් සහිත අභිලාෂක තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇතුළත් වේ. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 04 - සියල්ලන්ටම ඇතුළත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම, ගුණාත්මක අධ්‍යාපනය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සමඟ සෘජුවම සම්බන්ධ වේ. ඒ අනුව, මෙම වාර්තාව මූලික වශයෙන් හඳුනාගෙන ඇත්තේ අංක 01/2018 මුදල් චක්‍රලේඛ ලිපියේ හඳුනාගෙන ලැයිස්තුගත කර ඇති ප්‍රධාන ප්‍රතිපත්ති හතරට ආමන්ත්‍රණය කරමිනි.

1. උසස් අධ්‍යාපනයට ප්‍රවේශය
2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය
3. කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව
4. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම මාරු කිරීම

2. තිරසර සංවර්ධන ඉලක්ක (SDG) ක්‍රියාත්මක කිරීම හා සාක්ෂාත් කර ගැනීම

